(70)

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
# கமநல அபிவிருத்தித் திணைக்களம்
# DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. 7/11/4/45(චක්‍රලේඛ) | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2018.05 17 |

චක්‍රලේඛ අංක : 10 / 2018

සියළුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වරුන් හා

සියළුම ගොවිජන සේවා කාරක සහා විධායක ලේකම්වරුන් වෙත

**<u>මෙතෙක් කිසිදු කෘෂිකාර්මික ඉඩම් ලේඛණයක ඇතුලත්ව නොමැති ගොඩ ඉඩමක් අයිතිකරුගේ ඉල්ලීම මත ගොඩ ඉඩම් නාම ලේඛණයට ඇතුලත් කිරීම හා යම් ඉඩමක් කෘෂිකාර්මික ඉඩමක් නොවන බව ප්‍රකාශ කිරීම.</u>**

"මෙතෙක් කිසිදු කෘෂිකාර්මික ඉඩම් ලේඛණයක ඇතුලත්ව නොමැති ගොඩ ඉඩමක් අයිතිකරුගේ ඉල්ලීම මත ගොඩ ඉඩම් නාම ලේඛණයට ඇතුලත් කිරීම" යන මාතෘකාව යටතේ 2018.04.20 දිනෙන් නිකුත් කරන ලද 05/2018 චක්‍රලේඛය හා බැඳේ.එම චක්‍රලේඛයේ "ගොඩ ඉඩම් නාම ලේඛණ" යනුවෙන් සඳහන් වන සියළුම ස්ථාන වල "කෘෂිකාර්මික (ගොඩ) ඉඩම් නාම ලේඛණ" ලෙස වෙනස්විය යුතු බවත්, එම චක්‍රලේඛයේ "ගොඩ ඉඩමක්" ලෙස අදහස් කරන ලද්දේ "කෘෂිකාර්මික (ගොඩ) ඉඩමක්" බවත් මෙයින් දැනුම් දෙමි.

කිසිදු කෘෂිකාර්මික නාමලේඛණයක ඇතුලත්ව නොමැති, එසේම කෘෂිකාර්මික නොවන ගොඩ ඉඩම් (උදා:- කාර්යාල පරිශ්‍ර, ඉන්දන පිරවුම්හල් ආදි) සම්බන්ධයෙන් වන ඉල්ලීම් 05/2018 චක්‍රලේඛයේ ආවරණය නොවන අතර, එවැනි ඉල්ලීම් ඉදිරිපත් වන්නේ නම්, ඒ සඳහා 5/2018 චක්‍රලේඛයේ ඇමුණුම - 1 ආකෘතිය වෙනුවට මෙම චක්‍රලේඛයේ ඇමුණුම - 5 **(DAD/NA/2018/1)** ආකෘතිය පුරවා, ඇමුණුම - 6 ගැලීම් සටහනට අනුව ක්‍රියා කොට, ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කරන මෙන් වැඩිදුරටත් උපදෙස් දෙමි.

"ගෙවතු" කෘෂිකාර්මික ඉඩම් ලෙස සලකා ක්‍රියාකල යුතු අතර, 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත යටතේ මෙම දෙපාර්තමේන්තුවේ වගකීම් යටතට ගැනෙන්නේ කුඹුරු ඉඩම්, කෘෂිකාර්මික ගොඩ ඉඩම් හා ජලමූලාශ්‍ර පිහිටා ඇති ඉඩම් පමණක් බවද වැඩිදුරටත් සඳහන් කරමි.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, அ. பெ. 537, கொழும்பு 07.
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT, NO. 42, SIR MARCUS FERNANDO MAWATHA, P. O. BOX 537, COLOMBO 07.
දුරකථන/தொலைபேசிகள்/Telephones :

පොදු කාර්යාලය / பொது அலுவலகம் / General Office: 2694231, 2694232, 2694233, 2694234

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம் / Commissioner General of Agrarian Development: 2691060

ෆැක්ස් / தொலை நகல் / Fax: 2693572, 2691843, 2674481

E-mail : commissionerdad@yahoo.com

විදුලි පණිවුඩ / தந்தி / Telegram: ගොවිජනසේවා / கொவிசேவா / Agraservis

මහවැලි බලප්‍රදේශ සඳහා 5/2018 චක්‍රලේඛය මෙන්ම මෙම චක්‍රලේඛ උපදෙස් අදාල නොවන අතර, මහාවාරිමාර්ග බල ප්‍රදේශ වල පිහිටා ඇති ඉඩම් සම්බන්ධයෙන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව පමණක් ඊට අදාල ඉදිරිකටයුතු සිදුකරනු ලබන බව ද එසේම, විශේෂ සංරක්ෂණ කලාපය තුල පිහිටා ඇති ඉඩම් සම්බන්ධයෙන් ඊට අදාල ඉදිරිකටයුතු සිදුකිරීමේ වගකීම මෙම දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත, අදාල සංරක්ෂණ කලාපය පිළිබඳ වගකීම දරණ රාජ්‍ය ආයතනය විසින් සිදුකලයුතු බවද වැඩිදුරටත් සඳහන් කරමි.

එසේම මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් යම් පැහැදිළි කිරීමක් අවශ්‍ය වේ නම්, ඒ සඳහා මා අමතන මෙන් ද වැඩිදුරටත් දැනුම් දෙමි.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත්:-

1. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
2. ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය
3. ලේකම්, මහවැලි හා පරිසර අමාත්‍යාංශය
4. රාජ්‍ය ලේකම්
   කෘෂිකර්ම අමාත්‍යාංශය
5. අධ්‍යක්ෂ ජනරාල්
   කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්
   වාරිමාර්ග දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්
   මහවැලි සංවර්ධන අධිකාරිය
8. අධ්‍යක්ෂ ජනරාල්
   නාගරික සංවර්ධන අධිකාරිය
9. සභාපති
   ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය
10. සාමාන්‍යාධිකාරි
    මධ්‍යම පරිසර අධිකාරිය
11. සභාපති
    පතල් හා කැනීම් කාර්යාංශය
12. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - මේ සම්බන්ධයෙන් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැන්වත් කිරීම සඳහා
13. සියළුම නාගරික කොමසාරිස්වරුන් වෙත
14. සියළුම ප්‍රාදේශීය සභා ලේකම්වරුන් වෙත
15. සියළුම වාණිජ බැංකු වෙත - මේ සම්බන්ධයෙන් සියළුම ශාඛා කළමනාකරුවන් දැනුවත් කිරීම සඳහා.
16. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිළධාරීන් වෙත
17. සියළුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් වෙත

ඇමුණුම - 05

| ආකෘති අංකය - DAD/NA/2018/1 | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනු අංකය | DAD | NA | | | | |

## කෘෂිකාර්මික නොවන ඉඩමක් ලෙස ප්‍රකාශ කිරීම.

**1 පිහිටීම**

1.1 දිස්ත්‍රික්කය :

1.2 ප්‍රා.ලේ. කොට්ඨාශය :

1.3 ගොවිජන සේවා මධ්‍යස්ථානය :

1.4 කෘ.ප.නි.ස. කොට්ඨාශය :

1.5 ග්‍රා.නි. කොට්ඨාශය :

1.6 ගම :

**2 ඉඩම් පිළිබඳ තොරතුරු**

2.1 ඉඩමේ නම :
2.2 වෙනත් නම්:
2.3 මායිම් : උ: .......................... නැ: ..............................
ද: .......................... බ: ..............................
2.4 බිම් ප්‍රමාණය: අ. ........... රූ: .......... පර්. .......... (හෙක්ටයාර් ............ )
2.5 මිනින්දෝරු තැනගේ නම :
*
2.6 පිඹුරේ අංකය: දිනය: ..................... කැබලි අංකය: .....................
2.7 ඉඩමේ භාවිතය(Land Use) (√) : ව්‍යාපාර ☐ කාර්යාල ☐
කර්මාන්තශාලා ☐ වෙනත්................☐(සඳහන් කරන්න)

2.8 මෙම ඉඩමේ ස්ථිර නිවාස හෝ ගොඩනැගිලි ඉදිකර ඇත්නම්, ඒවා මානක සිතියමේ සලකුණු කර තිබිය යුතුයි.

ස්ථිර නිවාස හෝ ගොඩනැගිල්ල ඉදිකල වර්ෂය ☐☐☐☐

** ඒ බව සනාථ කරන වෙනත් ලියකියවිලි

1..............................................

2..............................................

3..............................................

**(* පසුගිය වසර 5 තුල පිලියෙල කල පිඹුරක් විය යුතුයි)**

**(** ඉඩමේ වර්තමාන තත්වය දැක්වෙන, මාස 3 ක් ඇතුලත ලබාගත් වර්ණ ඡායාරූප 3ක් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය.මෙයට අමතරව විදුලි බිල්පත්/ජල බිල්පත්/වරිපනම් ගාස්තු බිල්පත්/දුරකථන බිල්පත්/පලාත් පාලන ආයතන වල නිර්දේශ ආදිය ඉදිරිපත් කල යුතු වේ.)**

2.9 බහුවාර්ෂික ශාක තිබේනම්, එම ශාක පිළිබඳ තොරතුරු:

| | ගස් වර්ගය | ගස් සංඛ්‍යාව | වගාවේ වයස |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

**3 <u>අයදුම්කරු පිලිබඳ තොරතුරු</u>:**

3.1 සම්පූර්ණ නම :

3.2 ලිපිනය :

3.3 ජා.හැ.ප.අංකය :

3.4 දුරකථන අංකය :

**4 <u>අයිතිය පිළිබඳ තොරතුරු</u>**

4.1අයිතියේ ස්වභාවය: සින්නක්කර ඉඩම් ☐

තනි අයිතිය ☐ හවුල් අයිතිය ☐

සින්නක්කර අයිතිය සනාථ කරන සාධන පත්‍ර පිළිබඳ තොරතුරු

ඔප්පු /බලපත්‍ර අංකය: දිනය:

නොතාරිස් තැනගේ නම: පෙර ලියාපදිංචිය:

*** හවුල් අයිතියක් වේනම්, අනෙකුත් අයිතිකරුවන් පිලිබඳ තොරතුරු:**

**(*හවුල් අයිතියක් වේනම්, අනෙකුත් අයිතිකරුවන් විසින් මේ සඳහා එකඟතාවය ලබාදුන් දිවුරුම් ප්‍රකාශ මෙයට යාකල යුතුයි.)**

| | නම | ලිපිනය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

4.2 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (LRC) අයත් ඉඩම් ☐

4.3 රාජ්‍ය ප්‍රදාන

පැවරුම් ☐ දිගුකාලීනබදු ☐ බලපත්‍ර ☐ වෙනත්.................. ☐

අවසර පත්‍රය/ප්‍රදාන පත්‍රයේ අංකය: දිනය:

පිඹුරේ අංකය : කැබලි අංකය: දිනය:

**5 විශේෂ බලප්‍රදේශය**

5.1 මහා වාරිමාර්ග බල ප්‍රදේශය

මෙම ඉඩම යම් මහා වාරිමාර්ග බල ප්‍රදේශයක් තුල පිහිටා තිබේ නම්,

වාරි කර්මාන්තයේ නම:

වම් ඉවුර ☐ දකුණු ඉවුර ☐

ඉඩම් හිමියාට අයත් කුඹුරු ඉඩම පිහිටි

බෙදුම් ඇල අංකය: කෙත් ඇල අංකය:

5.2 පරිසර සංවේදී කලාප

මෙම ඉඩම වෙනත් පරිසර සංවේදී කලාපයක් තුල පිහිටා තිබේ නම්, ඒ පිළිබඳ තොරතුරු

පරිසර සංවේදී බලප්‍රදේශයේ නම:

පාලනය කරනු ලබන රාජ්‍ය ආයතනය:

පරිසර සංවේදී කලාපය ප්‍රකාශයට පත්කරන ලද වර්ෂය: ☐☐☐☐

---

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරන අතර, එම කරුණු සලකා බලා, මෙම කෘෂිකාර්මික නොවන ඉඩම ගොඩ, කෘෂිකාර්මික ඉඩමක් නොවන බව ප්‍රකාශ කරන මෙන් කාරුණිකව ඉල්ලමි. එමෙන්ම මවිසින් ඉදිරිපත් කරන ලද තොරතුරු හා ලේඛන වැරදි සහගත බැව් සනාථ වුවහොත්, මේ සම්බන්ධයෙන් ලබා දෙන අනුමැතිය අවලංගු වන බව හා නීතිය හමුවේ වරදකට වැරදිකරු විය හැකි බව පිලිගනිමි.

දිනය: ..................................

අයදුම්කරුගේ අත්සන

---

<u>ගොවි සංවිධාන නිර්දේශය</u>

ඉහත තොරතුරු අනුව, මෙම ඉඩම කෘෂිකාර්මික නොවන ඉඩමක් ලෙස ප්‍රකාශ කිරීම සුදුසු බව ........................................... දින පැවති ගොවි සංවිධාන කාරක සභා රැස්වීමේ දී තීරණය කරන ලදී.

.................................. ..........................................

| | |
|---|---|
| ගරු සභාපති | ගරු ලේකම්, |
| නම: | නම: |
| දිනය: | දිනය: |
| නිල මුද්‍රාව: | නිල මුද්‍රාව: |

---

සටහන : අදාළ නොවන තොරතුරු සම්බන්ධයෙන්, "අදාළ නොවේ" යන්න සටහන් කරන්න

## කෘ.ප.නි.ස.වරයාගේ නිර්දේශය:

(අ)මෙම ඉඩම වර්තමානයේ පවතින කිසිදු කෘෂිකාර්මික ඉඩම් ලේඛණයක ඇතුලත්ව නොමැත,

(ආ)මෙම ඉඩම වෙනත් රාජ්‍ය ආයතනයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද විශේෂ බල ප්‍රදේශයක පිහිටා ඇත/නැත, (අනවශ්‍ය වචනය කපා හරින්න)

(ඇ)එසේ පිහිටා තිබේනම්,

එම රාජ්‍ය ආයතනයේ නම :

විශේෂ බල ප්‍රදේශයේ නම :

එම බල ප්‍රදේශය ප්‍රකාශයට පත් කල වර්ෂය: | | | | |

ඉහත තොරතුරු නිවැරදි බවත්, ............................ දින මවිසින් මෙම ඉඩම පෞද්ගලිකවම පරීක්ෂා කල බවත්, ඒ අනුව මෙම ඉඩම කෘෂිකාර්මික නොවන ඉඩමක් ලෙස ප්‍රකාශ කිරීම සුදුසු බවත් නිර්දේශ කරමි.

දිනය:

.................................

අත්සන

නම:

බල ප්‍රදේශය:

නිල මුද්‍රාව:

## ගොවිජන සේවා කාරක සභාවේ නිර්දේශය (අනවශ්‍ය වචන කපා හරින්න)

.................................. දින පැවති ගොවිජන සේවා කාරක සභා රැස්වීමේ දී පහත සඳහන් නිර්දේශ ලබා දෙන ලදි. (අනවශ්‍ය නිර්දේශ කපා හරින්න)

(අ) මෙම ඉඩම කිසිදු කෘෂිකාර්මික ඉඩම් නාමලේඛණයක මෙතෙක් ඇතුලත්ව නොමැත.

(ආ)අයදුම්පතේ සඳහන් තොරතුරු නිවැරදි බැවින්, මෙම ඉඩම කෘෂිකාර්මික නොවන ඉඩමක් ලෙස ප්‍රකාශ කිරීම සුදුසුය.

(ඇ)අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු පිළිබඳව සෑහීමට පත්විය නොහැකි බැවින්, මෙම ඉල්ලීම නිර්දේශ කල නොහැකිය.

ඈ)මෙම ඉඩම වෙනත් රාජ්‍ය ආයතනයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද විශේෂ බල ප්‍රදේශයක පිහිටා ඇති බැවින්, මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට පෙර, එම ආයතනයේ නිර්දේශ ලබා ගැනීම සුදුසුය.

දිනය:

| | |
|---|---|
| ..................... | ......................... |
| සභාපති | විධායක ලේකම් |
| නිල මුද්‍රාව | නිල මුද්‍රාව |

*ප්‍රාදේශීය ඉංජිනේරු/තාක්ෂණ නිළධාරිගේ නිර්දේශය (අනවශ්‍ය ජේද කපාහරින්න)

(1) ඉහත ඉඩම ........................ දින මවිසින් පරික්ෂා කල බවත්, පහත සඳහන් කොන්දේසි වලට යටත්ව, මෙම ඉඩම කෘෂිකාර්මික නොවන ඉඩමක් ලෙස ප්‍රකාශ කිරීම සුදුසු බවත් නිර්දේශ කරමි.

අ. මෙම ඉඩම සඳහා වාරිමාර්ග/ඇල මාර්ග රක්ෂිත සීමා අදාල වේ/අදාල නොවේ.

ආ.ඉහත සඳහන් ජල මූලාශ්‍ර රක්ෂිත අදාළ ඉඩම තුළ පිහිටා තිබේ නම්, එම රක්ෂිත සීමා පිළිබඳ නිර්දේශ පහත සඳහන් කරමි.ඒ අනුව සංශෝධනය කරන ලද මානක සැලැස්මක් ඉදිරිපත් කිරීමට අයදුම්කරු ක්‍රියා කල යුතු වේ.

| | ජල මූලාශ්‍රය | යෝජිත රක්ෂිත/සංරක්ෂිත බිම (අඩි) | අදාල වන මායිම (උ,නැ,ද,බ) |
|---|---|---|---|
| I. | | | |
| II. | | | |
| III. | | | |

ඇ.වෙනත් කොන්දේසි වේ නම්,

I.

II.

(2) පහත සඳහන් හේතුමත මෙම ඉඩම කෘෂිකාර්මික නොවන ඉඩමක් බව ප්‍රකාශ කිරීම නිර්දේශ නොකරමි.

අ.

ආ.

ඇ.

(3) මෙම ඉඩම වෙනත් රාජ්‍ය ආයතනයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද විශේෂ බල ප්‍රාදේශයක් තුල පිහිටා ඇති බැවින්, ඉදිරි කටයුතු සිදුකිරීමට පෙර අදාල රාජ්‍ය ආයතනය විමසීමට හා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කිරීම සුදුසු බව නිර්දේශ කරමි.

දිනය:-

..................................

ප්‍රාදේශීය ඉංජිනේරු/තාක්ෂණ නිළධාරි

---

**(බිම් ප්‍රමාණය අක්කර 1 කට වඩා වැඩි ඉඩම් සඳහා ප්‍රාදේශීය ඉංජිනේරුගේ නිර්දේශය අත්‍යාවශ්‍ය වේ.)**

<u>ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයාගේ තීරණය</u>

2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත, 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන හා නිර්වචන අනුව, මෙම ඉඩම එම පනතින් ආවරණය නොවන කෘෂිකාර්මික නොවන ඉඩමක් බව ප්‍රකාශ කරමි.

..............................

ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්

දිනය:-

අත්සන

නිල මුද්‍රාව

## යම් ඉඩමක්, කෘෂිකාර්මික නොවන ගොඩ ඉඩමක් බව ප්‍රකාශ කිරීම

